# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

## පෝලීන් හැන්සන්, තෑන්ක්ස් මේට්!



වසර විස්සකට පසු යළිත් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් තේරී පත් වී අද දවසේ පුවත් මවමින් සිටින පෝලීන් හැන්සන් පිළිබඳව කලකට පෙර ලියවුණු මේ ලිපිය ප්‍රතිචක්‍රීකරණය කිරීම සුදුසු යැයි මට සිතුණි.

වසර 1996 දී ඕස්ට්‍රේලියාවේ වාසය කළ අප බොහෝ දෙනෙකුට පෝලීන් හැන්සන් සහ ඇය නිසා ඇතිවූ මහා දේශපාලනික කලබගෑනිය තවමත් මතක ඇතුවාට සැක නැත.

ඒ කතාව කෙටියෙන් මෙසේය.

එම වසරේ පැවති ෆෙඩරල් මහා මැතිවරණයට ජෝන් හාවඩ්ලා ගේ ලිබරල් පක්ෂයෙන් ක්වීන්ස්ලන්තයේ ඔක්ස්ලි මැතිවරණ කොට්ඨාශයට ඉදිරිපත් වූයේ පෝලීන් හැන්සන් නමැති කඩචෝරු :සෙිය"බා ජයසචි* කඩයක් කළ කාන්තාවකි. ඇය ඡන්ද ව්‍යාපාරය අතරතුර කාලයේ දී, ස්වදේශික ඇබොරිජිනල් ජාතිකයින් පිළිබඳව කට කැඩිච්ච කතාවක් කළා ය. ඇගේ ඒ ප්‍රකාශය ලිබරල්

පක්ෂයේ ප්‍රකාශිත ප්‍රතිපත්ති මාලාවට පටහැණි එකක් වූ බැවින්, පෝලීන් පක්ෂයෙන් නෙරපීමට ජෝන් හාවර්ඩ්ලා ට සිදුවිය. නමුත් ඇය දිගටම එවැනි ප්‍රකාශ කරමින් සිට අවසානයේ ස්වාධීන අපේක්ෂිකාවක් ලෙස කම්කරු පාක්ෂික අපේක්ෂකයා පරදවා ආසනය දිනාගත්තා ය. මේ සඳහා රට වටා සිටි අන්තවාදීන් ගේ විවිධාකාර සහය ද ඇයට නොඅඩුව ලැබුණි. පෝලීන් පාර්ලිමේන්තුවේ කළ මංගල කථාවෙන් කියා සිටියේ රජයේ සංක්‍රමණ ප්‍රතිපත්ති නිසා වැඩි වැඩියෙන් මෙරටට ආසියාතිකයින් පැමිණ ඉතා නුදුරේ දී ම මෙරට තුළ සුදු ඕස්ට්‍රේලියානුවන් සුළුතරය බවට පත්වෙන්නට යන බවයි.
මෙහිදී ආසියානුවන් යනුවෙන් පොදුවේ අදහස්වන්නේ ප්‍රධාන වශයෙන්ම චීන ජාතිකයින් ය. අප අයිතිවන්නේ ඉන්දියානුවන් ගොඩට ය.

කථාවෙන් පසු පෝලීන් හැන්සන් "වන් නේෂන්" නම් දේශපාලන පක්ෂයක් පිහිටුවා ගත් අතර ඇයට පක්ෂව ද, විපක්ෂව ද ජනයා පෙළ ගැසුණහ. සාමාන්‍යයෙන් ප්‍රගතිශීලී කොටස් ඇයට විරුද්ධව ප්‍රකාශ නිකුත් කළ ද, පොදු ජනතාවගෙන් සියයට දහයක පමණ විශාල ප්‍රමාණයක් ඇයට පක්ෂ බව පෙනී ගියේය. තවත් බොහෝ පිරිස් ඇයට නිහඬ සහයෝගය දක්වන බව පැහැදිලි විය. සමානාත්මක සමාජයක් පවතින ඕස්ට්‍රේලියාව ජාතිභේද මත ධ්‍රැවීකරණය වී, අපට ආපසු ශ්‍රී ලංකාවට යන්නට වේ දැයි විටෙක මට නොසිතුණා නොවේ.
කම්කරු පක්ෂය කෙසේ වුවද, ගතානුගතික දේශපාලකයෙකු වූ එවකට අගමැති ජෝන් හාවඩ් නම් පෝලීන් හැන්සන් ගේ අදහස් වලට විරුද්ධ නොවී ඇල්මැරුණු ස්වභාවයක් පෙන්නූයේ කකකට ඉහත ඔහු ද මෙවැනිම අදහස් පල කළ අයෙකු වූ බැවිනි. ස්වදේශික ඇබොරිජිනල් ජාතිකයන් ගැන නම් ඔහු ගේ අදහස් එවකටත්

ආසියාතිකයින් මෙරටට පැමිණ, සිය ජන කොටස් සමග ගුබ්බෑයම් :ටයැඑඑද* වලට වී ජීවත්වනු මිසක පොදු ඕස්ට්‍රේලියානුවන් සමග මිශ්‍ර නොවන බව ද ඇය කීවාය. දිනක කහ හම ඇති ජනවර්ගය ලොව රජවන බවට ඇති පුරාණ අනාවැකියක් ද ඇය එකල සිහි කළාය. ඇගේ මේ කථාවෙන් ගිනි ගොඩක් ඇවිලුනි. ඔසී දේශය පුරා ජාතිවාදී ප්‍රවනතාවක් ඉස්මතු වෙන්නට පටන් ගති.

ඇගේ මේ ජාතිවාදී කතා ඇබොරිජිනල් ජාතිකයන් වෙතට ද එල්ල වූයේ ඔවුන් සමාජ සුබසාධන වේතන ලබමින් කල් මරණ බව කියමිනි.

මේ

එලෙසම විය.

මුලදී යම් ප්‍රගතියක් පෙන්නුම් කළත්, පෝලීන් හැන්සන් ගේ දේශපාලන ගමන ඉතා වේගයෙන් වල පල්ලට ගියේය. ඇගේ පාර්ලිමේන්තු කාලය වසර තුනකට පමණක් සීමා වූ අතර, වන් නේෂන් පක්ෂය කැඩී දියවී අවසානයේ මැතිවරණ අරමුදල් වංචාවකට අසුවී ඇයට වසරක් පමණ කාලයක් සිරබත් කන්නට ද සිදුවිය.

ඉන් පසු ටික කලක් දේශපාලනයෙන් පසු බැස සිටි සහ වරක් එංගලන්තයට සංක්‍රමනය කරන්නට පවා සැරසුණු පෝලීන් හැන්සන් පසුව දෙතුන් වරක් ප්‍රාන්ත මහමැතිවරණවලින් ද පැරදුණා ය.
නමුත් මෙවට වසර විස්සකට පසු ඇය යළිත් ජය ගත්තේ ෆෙඩරල් සෙනෙට් සභාවේ ආසන තුනක් ම ඇගේ වන් නේෂන් පක්ෂයට දිනා ගනිමිනි. කවුරු මොනවා කිව්වත්, මා නම් පෝලීන් හැන්සන් ට සැමද ස්තුතිවන්ත වෙන කාරණයක් ඇත. එනම්, සුළු ජාතිකයෙකු ලෙස සිතීමේ අවස්ථාවක් ඇය මට ලබා දුන් නිසයි. වසර තිස් දෙකක් ලංකාවේ මහ ජාතියේ සාමාජිකයෙකු වශයෙන් ජීවත් වී සිටි මට සුළු ජාතිකයන් සිතන්නේ කෙලෙසද යන්න පිළිබඳව කිසිදු අත්දැකීමක් නොවිණි. "දෙමළ මිනිස්සුන් ට ඇත්තේ මොන ප්‍රශ්න ද?" යනුවෙන් අවස්ථාවාදී දේශපාලන මත දරන්නන් විසින් ප්‍රශ්න කරන විට එයට විරුද්ධ වීමට වඩා එකඟ වීම මට ඉතා පහසු විය.

**<u>නමුත් පෝලීන් හැන්සන් සංසිද්ධිය අතර තුරේ, මා ඕස්ට්‍රේලියාව තුළ සුළු ජාතිකයෙක් ය යන හැඟීම මා සිත තුළට කා වැදී, ඒ සමගම ඇතිවූ බිය, සැක, චංචලත්වය සහ අනාරාක්ෂිත හැඟීම නිසා, මහ ජාතියේ බලය පෙන්වන විට සුළු ජාතිකයෙකු මුහුණ පාන තත්වය ගැන සැබෑ අත්දැකීමක් මට ලැබුණි.</u>**

නමුත් පෝලීන් හැන්සන් සංසිද්ධිය අතර තුරේ, මා ඕස්ට්‍රේලියාව තුළ සුළු ජාතිකයෙක් ය යන හැගීම මා සිත තුළට කා වැදී, ඒ සමගම ඇතිවූ බිය, සැක, චංචලත්වය සහ අනාරාක්ෂිත හැඟීම නිසා, මහ ජාතියේ බලය පෙන්වන විට සුළු ජාතිකයෙකු මුහුණ පාන තත්වය ගැන සැබෑ අත්දැකීමක් මට ලැබුණි.

පෝලීන් හැන්සන්, මම ඒ පිළිබඳව ඔබට සදා ණය ගැති වෙමි.

---

16 වන පිටෙන්

ලබාගනිමින්. වරින් වර වෘත්තීය මට්ටමට පා තැබූ යෞවනියන්ගේ වීඩියෝ දර්ශන තිරගත කිරීමද ඉහළ මට්ටමක විය. පසු තිරයේ දර්ශනවලින් ඒ ඒ නැටුම් අංග වෙනුවෙන් ලැබුණ දායකත්වය ද අතිමහත්. සජීව ලෙස චලන රූප ''ඇනිමේෂන්'' තාක්ෂණයෙන් යුතුව ඉදිරිපත් කළ ආකාරය ප්‍රශංසනීයයි. ඊටම බැඳුනු ආලෝකකරණයත්, ශබ්ද පරිපාලනයත් මනා සේ පෑහී ප්‍රසංගය වර්ණවත් හා මිහිරි ප්‍රසංගයක් බවට පත් කරවීය. විටින් විට ඉදිරිපත් වූ දැරියන් සය දෙනාගේ නරතනවල ඒ ඒ අංගය සඳහා එක සිසුවියක් මූලිකව නර්තනයේ යෙදීමට සැළැස්වීම ද නැවුම් අදහසකි. ඒ ඇයට අදාල රූප පෙළ තිරයේ ඇව හඳුන්වා දුන් පසුවයි. මේ වෘත්තීය මට්ටමේ සිසුවියන් ඇඳුම් මාරුකරන අතරේදීයි අනෙක් අංග ඉදිරිපත් වූයේ. නර්තනාචාර්ය වරිය විසින්ම නිර්මාණය කළ ඇඳුම් සහ වෙස් ගැන්වීම් මනාව ගැලපී ප්‍රශස්ත මට්ටමක විය. ඇය විසින් ම තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගෙන ගීත යා කොට නර්තන අංග සඳහා සකස් කරගෙන තිබුණු අන්දමද අගෙයි.

ප්‍රසංගය ඉදිරිපත් කළ දෙපළ ද ප්‍රසන්න ලෙස සිය කර්තව්‍ය වගකීමකින් යුතුව කළේ ප්‍රසංගය පුරාවටම සමබර බව රකිමිනි. අංගයෙන් අංගය සවිස්තරව ලිවිය හැකි වූ ප්‍රසංගයක් වුවද නර්තනාභිෂේක ප්‍රසංගය සියැසින් දුටු පිරිසට අසාධාරණයක් වෙතැයි යන අනුමානයේ මේ සටහන නිමා කළ යුතුව ඇත. ප්‍රේක්ෂකාගාරයේ විඳි දේ වචනයෙන් සටහන් තැබිය නොහැකි නිසයි ඒ.

පන්හිඳ ලියලා ඉවරවෙනකොට අනික් දෙන්නා නින්දටත් ගිහින් තිබුණා.

**ශ්‍රී ලාංකික වෙළඳසළ විකිණීමට**

**වසර දොළහකට වැඩි කාලයක්
සාර්ථක ලෙස පවත්වාගෙන යන
විශාල කීර්තිනාමයක් හිමි
ශ්‍රී ලාංකික වෙළඳසල
විකිණීමට ඇත**

නිර්ව්‍යාජ ගැණුම්කරුවන් පමණක් විමසන්න
0430 246 884